# පාරිසරික සංචාරක ගමනාන්තයක් ලෙස මී මුරේ ගම්මානය ආශ්‍රිතව ගැටළු පිළිබඳව අධ්‍යයනයක්

*එස්.ජී.එම්.අයි පුෂ්පකුමාර* [1]

මී මුරේ යනු ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ පිහිටි පාරිසරික සංචාරක කර්මාන්තය සඳහා ප්‍රමුඛ ස්ථානයක් ලෙසින් හඳුනා ගත හැක. මී මුරේ ගම්මානයේ ජීවත්වන්නන් පාරිසරික සංචාරය මුලික කර ගනිමින් ඒ ආශ්‍රිතව රැකියාවල නිරත වෙමින් පරිසර හිතකාමී ආකාරයෙන් ගම්මානය තුළ ජීවත් වේ. පාරිසරික සංචාරය ඉහළ නැංවීම උදෙසා ඉහළ ජෛව විවිධත්වයක් පවතින දියඇලි, දිය උල්පත් , කඳු පන්ති හා ස්වභාවික පරිසරය යනාදිය සංචාරක ආකර්ශනය දිනාගත් සුවිශේෂී අංගයන් ලෙසින් හඳුනාගත හැකිය. මී මුරේ ගම්මානය ආශ්‍රිතව පාරිසරික සංචාරක ස්ථානයන් විනාශ කිරීම හා ඒ කෙරෙහි විවිධ බලපෑම් ඇති කිරීමට යොමුවීම හඳුනාගත හැකි අතර එය වර්තමානයේ ප්‍රබල ගැටලුවක් බවට පත් වී තිබේ. මී මුරේ සංචාරක ගමනාන්තය ආශ්‍රිතව පවතින පාරිසරික සංචාරක ගැටළු හඳුනාගැනීම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ. මී මුරේ ගම්මානය ආශ්‍රිතව හඳුනාගත් පාරිසරික සංචාරක ගැටළු අවමකර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග හඳුනා ගැනීම හා පාරිසරික සංචාරක ගමනාන්තය කෙරෙහි ලෝකයේ ඉහළ ඉල්ලුමක් පවතින අතර එය හඳුනාගෙන සංචාරක ප්‍රවර්ධනය ඇති කිරීම හා සංචාරක විභවතාවයන් හඳුනා ගැනීම අධ්‍යයනයේ වැදගත්කම ලෙසින් හඳුනාගත හැකිය. අධ්‍යනයට අවශ්‍ය වන දත්ත හා තොරතුරු රැස් කිරීම ප්‍රාථමික හා ද්විතීක දත්ත මූලාශ්‍රයන් භාවිතා කරමින් සිදු කරනු ලැබීය. මී මුරේ සංචාරක ගමනාන්තය වෙත පැමිණෙන සංචාරකයන් අතරින් සරල සසම්භාවී නියැදි ක්‍රමය යටතේ සංචාරකයින් 30 දෙනෙකු තෝරාගෙන ඔවුන්ගෙන් ප්‍රශ්නාවලි ක්‍රමය යටතේ ප්‍රාථමික දත්ත රැස් කිරීම සිදු කරන ලදි. එසේම මී මුරේ සංචාරක ගම්මානයේ ගම්වාසීන් සමගින් ව්‍යුහගත නොවන ආකාරයේ සම්මුඛ සාකච්ඡා මඟින් හා ගමනාන්තය ආශ්‍රිතව නිරීක්ෂණය කිරීම තුළින් ද දත්ත ඒකරාශී කරනු ලැබීය. අධ්‍යයනය සඳහා අවශ්‍ය දත්තයන් මහනුවර දිස්ත්‍රික් සංචාරක තොරතුරු කේන්ද්‍රය, සංචාරක සංවර්ධන මණ්ඩලය හා මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ද්වීතීක දත්ත ඒකරාශි කරන ලදි. එසේ රැස් කරගත් දත්තයන් වගු , ප්‍රස්තාර , ඡායාරූප හා භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) උපයෝගී කර ගනිමින් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී. අධ්‍යනයට අනුව මී මුරේ පාරිසරික සංචාරය සඳහා අතීතයට සාපේක්ෂව දෙස් විදෙස් සංචාරක ඉල්ලුමක් පවතින ආකාරය හඳුනා ගැනීමට හැකි විය. සංචාරක ගමනාන්තය ආශ්‍රිතව ප්‍රවාහන ක්ෂේත්‍රයේ දුර්වලතා, පාරිසරික විනාශය, යටිතල පහසුකම්වල දුර්වලතා හා සංචාරක ගමනාන්තය සංරක්ෂණය කිරීම තුළ පවතින ගැටලු හඳුනා ගැනීමට හැකිවිය. එසේම පාරිසරික සංචරණය දිරිමත් කිරීම උදෙසා ගතහැකි ක්‍රියාමාර්ගයන් හඳුනා ගැනීමට හැකියාව ලැබුණි.

**මුඛය පද -** *පාරිසරික සංචරණය, සංචාරක, කර්මාන්තය, ගැටළු*

[1] පුරාවිද්‍යා අධයයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. hmadurangaimesh100@gmail.com